# පත්තිනි දෙවඟන පිදීම වෙනුවෙන් රඟ දක්වන සොකරි නාටකයෙහි පැනවෙන කාන්තා වාරණය පිළිබඳ අධ්‍යයනයක්

එම්. ආර්. ගුණරත්න [1] කේ. ඒ. සී. එස්. ආනන්ද[2], එම්. ඒ. ගුණරත්න[3]
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය[12], කොළඹ විශ්වවිද්‍යාලය[3]
malki.gunaratne@gmail.com

ශ්‍රී ලාංකික කෘෂිකාර්මික අර්ථ ක්‍රමය තුළ දී සශ්‍රීකත්වය අපේක්ෂාවෙන් සිදු කරනු ලබන ගැමි නාටකයක් ලෙස සොකරි නාටකය හඳුන්වා දිය හැකි ය. උඩරට පළාත්වලත්, වන්නියේත්, සතර කොරළයේ ඇතැම් ප්‍රදේශ වලටත් සීමා වී අනුරූපණ මාධ්‍යයෙන් ඉදිරිපත් කරනු ලබන සොකරි නාටකය දකුණු ඉන්දියානු ප්‍රභවයක් සහිත කතා පුවතක් පදනම් කොටගනිමින් ගොඩනැගී ඇත. සොකරි නාටකය හුදෙක් ගැමි නාටකයක්ම නොව ශාන්ති කර්මයක් ලෙසද ඇතැමුන් විග්‍රහ කරනු ලබන්නේ එහි අවසනහී දි පත්තිනි දෙවියන් ප්‍රමුඛව සිදු කෙරෙන සුදු අභිචාරාත්මක පූජා විධිය සාධක කොට ගනිමිනි. පතිව්‍රතාවේ බල මහිමයෙන් දේවත්වයට පත් ස්ත්‍රියක වන පත්තිනි දෙවියන් පිදීමේ දී ස්ත්‍රියට ලැබෙන ප්‍රමුඛ ස්ථානය සොකරි ගැමි නාටකයෙහි දක්නට නො ලැබෙන්නේ පොදු ජන මතයක් වශයෙන් කිලි සංකල්පය ප්‍රමුඛ වී ඇති බැවිනි. සොකරි නාටකයේ ස්ත්‍රී චරිත නිරූපණයේදී කාන්තාවට පැනවෙන වාරණය සඳහා ලාංකීය ආගමික හා සමාජ සංස්කෘතික රාමුව බලපා ඇත යන උපන්‍යාසය මත පිහිටා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. එනමුත් දේශීය ශාන්ති කර්ම කලාවේ පැනවෙන ස්ත්‍රී වාරණයත්, ගැමි ජන සමාජය තුළ ශුද්ධ භූමියක් වූ කමතෙහි තිබූ ස්ත්‍රී වාරණය අඛණ්ඩව පවත්වා ගැනීමත්, දකුණු ඉන්දියානු චතුර්වර්ණ සංකල්පය තුළ ස්ත්‍රිය ආන්තීකරණය වීම දකුණු ඉන්දියානු ප්‍රභවය සහිත සොකරි කතා පුවතෙහි දුර්වල නො වීමත්, කාන්තාවට වඩා ප්‍රබල ලාස්‍යයෙන් යුතු නිරූපණයන් පුරුෂයන්ට සිදුකල හැකි වීමත්, ශ්‍රී ලාංකික පීතෘ මූලික සමාජ ආකල්පයන් ප්‍රබලව නැගී සිටීමත් යන සාධක මත සොකරි නාටකය තුළ කාන්තා චරිත නිරූපණයට ස්ත්‍රියට ඉඩ හසර නො ලැබී ඇති බව මෙම අධ්‍යයනයේ දී අනාවරණය කරගත හැකි විය. එපමණක් නොව, නවගමුව මූලික කොට ගනිමින් පත්තිනි ඇදහිල්ල පහතරට ප්‍රදේශ ආශ්‍රිතව ව්‍යාප්ත වුවද උඩරට ප්‍රදේශයට සීමා වූ සොකරි ගැමි නාටකයට පත්තිනි ඇදහිල්ල ඈදා ගැනීමේදී උඩරට කුල සම්ප්‍රදාය හා සම්ප්‍රදායික කාන්තාවගේ ස්ථානය ආරක්ෂා කරගැනීමට හුදී ගැමි ජනයා පෙළඹී ඇති බැවි සොකරි ගැමි නාටකය තුළ පනවා ඇති ස්ත්‍රී වාරණය තුළින් මනාව විද්‍යමාන වෙයි. ඉහත කරුණු අනාවරණය කර ගැනීමේ දී පර්යේෂණ ක්‍රමවේද ලෙස පුස්තකාල විමර්ශනය හා සම්මුඛ සාකච්ඡා උපයෝගී කර ගන්නා ලදී. ඒ අනුව සොකරි ගැමි නාටකය තුළ කාන්තා වාරණය පැනවෙන්නේ කිලි සංකල්පය මත පදනම්ව නම් පමණක් ආර්තව කාලය මඟහැර සොකරි රඟ දැක්වීමට කාන්තාවට අවස්ථාව සැලසිය යුතුය. එසේම පත්තිනි දෙවඟන මූලික කොට ගනිමින් සිදු කරන කිරි අම්මාවරුන්ගේ දානයේදී ස්ත්‍රියටම මූලිකත්වය ලබාදීම මඟින් ප්‍රකට වනුයේ කිලි සංකල්පයට එහා ගිය අප අධ්‍යයනය තුළින් තහවුරු කර ගන්නා ලද ඉහත කරුණු ප්‍රබල වී ඇති බවයි.

**ප්‍රමුඛ පද:** පත්තිනි දෙවියන්; සොකරි ගැමි නාටකය; ස්ත්‍රී වාරණය; කිලි සංකල්පය, සුදු අභිචාර